රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி: **(94) 011- 2694560** Telephone
ෆැක්ස් தொலைநகல்: **(94) 011- 2692254** Fax
ඊ-මේල් மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

මගේ අංකය / எனது இல / My No: COMS/DO/TRANS/Special Vacancies (Web Publish)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.05.30

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු තුළ පවතින සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම.</u>**

විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මඟින් යොමුකර ඇති සේවක සංඛ්‍යා හා පුරප්පාඩු සංඛ්‍යා පිළිබඳ පරීක්ෂා කිරීමේදී කොළඹ, බත්තරමුල්ල ප්‍රදේශයේ පවතින ප්‍රධාන කාර්යාලවල හා කොළඹ, අනුරාධපුරය, පොළොන්නරුව, පුත්තලම, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, නුවරඑළිය වැනි දිස්ත්‍රික්ක වල ඇති දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාලවල හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරින්ගේ පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.

02. එසේම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වල ඇතැම් දිස්ත්‍රික්ක වල පවතින දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සංවර්ධන නිලධාරීන් අතිරික්තව සේවය කරන බවද නිරීක්ෂණය විය.

03. අනුමත තනතුරු ඉක්මවා නිලධාරීන් අනුයුක්ත කළ නොහැකි බැවින් ඔබ ආයතනය යටතේ වූ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික්/ප්‍රාදේශීය කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින අවශ්‍යතා පදනම් කරගෙන අනුයුක්තව සිටිය යුතු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව නිසි පරිදි හඳුනාගන්නා මෙන් ඉතා කාරුණිකව දන්වමි.

04. තවද අතිරික්ත නිලධාරීන් සිටීනම් ඔවුන් මනාපය පළ කරන සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීම සඳහා CS/T/01 ආකෘතිය අනුව ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස හා ස්ථාන මාරු ඉල්ලා ඇති ස්ථාන වල පුරප්පාඩු පවතී නම් එම ස්ථාන මාරු සිදුකළ හැකි බව අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් ද ඉතා කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්